# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2253/14 – 2021 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා – 2021.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 223 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2020/HW/204.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/1/32/V.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 05 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, කුරුණෑගල.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 808, වෙහෙරබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්බලන්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/KRN/2021/21 හා 2021.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

1. **කැබලි අංක 1 - කොලපැලැල්ලකන්දවත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0853**

උතුරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය සහ රෝයල් අන්තර්ජාතික පාසල; නැගෙනහිරට: රෝයල් අන්තර්ජාතික පාසල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරටඃ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය.

2. **කැබලි අංක 2 - කොලපැලැල්ලකන්දවත්ත- ප්‍රමාණයඃ හෙක්. 0.0101**

උතුරට සහ නැගෙනහිරට: යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය; දකුණටඃ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරටඃ යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය;

11 – 524



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*